## 01. අපට වැසිකිළියක් කෙටිකතාවෙහි සිද්ධි හා අවස්ථා නිරූපණයේදී කතුවරයා දක්වා ඇති චතුරතාව විමසන්න.

කේ. ජයතිලක නම් ලාංකේය කෙටිකතාවට මිණි පහනක් බඳු ලේඛකයාණන් විසින් රචිත "නොනිමි සිත්තම" නැමැති කෙටිකතා සංග්‍රහයෙන් උපුටා ගන්නා ලද "අපට වැසිකිළියක්" නමැති පිටිසරබද ප්‍රදේශයක මීට දශක අටකට හෝ නවයකට ඉහතදී සිදු වූ සංසිද්ධියක් කේන්ද්‍ර කරගනිමින් රචනා වූවකි. උත්තම පුරුෂ කථන මාධ්‍යයෙන් දිග හැරෙන මේ කතාවේ චිත්තරූප ජනනය වන ආකාරයෙන් අවස්ථා, සිද්ධි නිරූපණය කරන්නට කතුවරයා සමත් වී ඇති බව මෙතැන් සිට විමසා බලමු.

"අපට වැසිකිළියක්" කෙටි කතාවේ ප්‍රධාන චරිත ත්‍රිත්වයක් කේන්ද්‍ර කර ගනිමින් කතා පුවත දිග හැරේ. කථාව සැබෑ ලෙසම ඇරඹෙන්නේ ගමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ පැමිණීමත් සමගය. මේ අවස්ථාව කදිමට නිරූපණය කරන කතුවරයා එවේලෙහි කථකයාගේ මල්ලීගේ මුවට නංවන භාෂණය අපූරුය.

"අයියේ, අයියේ, පොලිස් කාරයෙක්!" හදිසියේම හතිලමින් අප වෙත දුව ගෙන ආ මල්ලී දෑත් වනමින් මට කතා කළේය.

කෙටි කතාවට උචිත වදන් මාලාව ගැන සැලකිලිමත් වෙමින් කතාකරණයේ යෙදුණු කතුවරයා සෞඛ්‍ය පරීක්ෂක වරයා ගම නිරීක්ෂණය කිරීමට පැමිණි පළමු අවස්ථාවේ වූ සිදුවීම් රැස පාඨක සිත් අලවන ආකාරයෙන් ඉදිරිපත් කරයි. ඉහත මල්ලීගේ හඬින් කුතුහලයට පත් තාත්තා සහ සුගතන් ඇඳෙන් නැගිට ගොස් පිල අද්දරට වී ඈත බඩ වැටිය දෙස නෙත් යොමා බලා සිටින ආකාරය අපි මනසින් දකින්නෙමු. ඒ අවස්ථාවේ කුණු ඉස්පැක්ටර් මහතා පිළිබඳව සුගතන්ගේ මුවින් ගිලිහුණු වදන් මාලාවද රාජකාරිය අකුරට ඉටු කරන සෞඛ්‍ය පරීක්ෂක වරයාගේ චර්යා රටාව කදිමට නිරූපණය කරන්නකි.

තවද කථකයාගේ නිවස වෙත පැමිණි ඉස්පැක්ටර මහතාගේ කථන විලාශය ඇලින්ද ප්‍රබල අවස්ථා සිද්ධි නිරූපණයක කතුවරයා නියැලෙයි. එදා දශක නවයකට පෙර අතීත සමාජයේ ජීවත් වූවන්ගේ ආගන්තුකයින් පිළිබඳ ආකල්පය, දැන උගත් රාජකාරි කරන පන්තිය හා ග්‍රාම්‍ය ජනයා අතර පවතින භාෂා, දැනුම් මට්ටම් වල වෙනස දිවි පෙවෙත හැඩ ගැසෙන ආකාරය ගැමියන්ගේ අල්පේච්ඡ බව ආදී දහසකුත් එකක් ලක්ෂණ එක් දෙබස් ඛණ්ඩයකින් නිරූපණය කරන්නට කතුවරයා දැක්වූ කුසලතාවය විශිෂ්ඨය.

"කවුද මේ ගෙදර ගෘහමූලිකයා" වචන සිංහල වුවත් උච්චාරණය සිංහල නොවීය. තාත්තාටද මෙය ගැටලුවක් වූ බව පෙනී ගියේ ඔහු විමතියෙන් සුගතන්ගේ මුහුණ බැලූ සැටියෙනි."

කතා වින්‍යාසයේ හරවත් බවත්, රසවත් බවත් ගම්‍ය වනයේ උචිත අයුරින් සංවාද ශෛලිය කතාවට ඈඳා ගත් අවස්ථාවකට මේ කදිම නිදසුනකි. ඈත පිටිසර ගම් පෙදෙසක සැබෑ තත්ත්වය සහෘද හද වෙත ප්‍රකම්පනය කරන්නට කෙටිකතා කරුවා ගෙන ඇති උත්සාහය අගනේ ය. ග්‍රාමීය ජන ජීවිතය තුළට ශිෂ්ට ජන සිරිත් සම්ප්‍රේෂණය කිරීමට ගමට පැමිණි සෞඛ්‍ය පරීක්ෂකවරයා ඒ සඳහා ගත් පියවර සංක්ෂිප්ත ලෙසත් තාත්වික ලෙසත් කතුවරයා විසින් නිරූපිතය. ඒ මෙසේය.

"කොල්ලෙ මේ මහත්තයට වතුර පතිට්ටුවක් ගෙනත් දීපිය" කියලත් කිව්වලු. මිනිහට තරහ ගිය පාර එවෙලම හඬු දාන්න ලියා ගත්තාලු"

සුගතන් විසින් අනන්‍යයන් ඉදිරියේ ඉස්පැක්ටර් මහතාගේ ක්‍රියා කලාපය හෑල්ලුවට ලක්කළේ උපහාසය මුඛයෙනි. ගැමියෙකුගේ නිවසකට ගොස් වැසිකිළියක් තිබේදැයි ඉස්පැක්ටර් මහතා විමසා සිටි අවස්ථාවේ එම නිවැසියන් ලබා දුන් පිළිතුරු පුරුෂෝක්ත උපුටනයෙන් දැක්වේ.

download from : rmsnmath.blogspot.com

අතීත ගම්මාන වල ජනයා නාගරික ජන සමාජ වල සිදුවන වෙනස්කම් අද මෙන් වේගයෙන් වැළඳ ගැනීමට උත්සාහ නොකළෝය. නාගරික ගති සිරිත් කාලයාගේ ඇවෑමෙන් ගමට සැපත් වේ. මේ සංසිද්ධිය සියා පෑමට කතුවරයා කෙටිකතාවේ සෑම වචනයක්ම උචිත ආකාරයට යොදා ගනී. එලෙස යොදා ගැනීම තුළ පාඨකයාගේ සිත ඈත අතීත ජන සමාජය වෙත කැඳවාගෙන යන්නට කතුවරයා සමත් වෙයි.

අධ්‍යාපනය මගින් සෞභාග්‍ය සම්පන්න සමාජයක් ඇති කිරීමට දරන උත්සාහයත් ඒ අනුව පාඨකයා තමන් පළමුවත් දෙවනුව නිවසියනුත් අලුත් සම්ප්‍රදායට හුරු කර ගන්නා ආකාරයත් අවස්ථා සිද්ධි අනුසාරයෙන් ජීවමාන රූපාවලියක් බවට පත් කිරීමට කතුවරයාණෝ සමත් වූහ.

**02. වැසිකිළියක් සැකසීමේ ව්‍යාපාරය මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා ජය ගත්තද, එය භාවිත කිරීමේ ජයග්‍රහණය ලබන්නේ කථකයායි. ''අපට වැසිකිළියක්'' කෙටිකතාව ඇසුරින් පහදන්න.**

කේ. ජයතිලක රචකයාණන්ගේ ''හොහිම් සිත්තම'' නැමැති කෙටි කතා සංග්‍රහයේ එන ''අපට වැසිකිළියක්'' පබැඳුම මීට දශක අටකට, නවයකට පෙර ලාංකේය ජන සමාජයේ ඈත එපිට පිටිසර ගමක සිදු වූ සමාජ සංසිද්ධියක් තේමා කරගෙන රචනා වූවකි. රජය විසින් ගම්වල සෞඛ්‍ය සම්පන්න පුරුදු ඇති කිරීම පිණිස අනුබල දීමත් ඒ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ක්‍රියාත්මක වීමත්, සිදු කරනු ලබති. වැසිකිළිය තැනීම මෙතෙක් ගම්බද පැවති ''ගැමි සිරිත'' බිඳීමක් වුවද එයට අනුවර්තනය වීම සඳහා ප්‍රථම පියවර මෙහි ප්‍රධානතම චරිතය වූ කථකයා විසින් ගනු ලබයි.

''අය්යේ, අය්යේ, පොලිස් කාරයෙක්!'' හදිසියේ ම හතිලමින් අප වෙත දුවගෙන ආ මල්ලී දෑත් වනමින් මට කතා කළේය.''

මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයාගේ චරිත ස්වභාවය හා ඔහු මෙහි පැමිණීමේ අරමුණ, කතාවිත්‍යාසයට මැනවින් බද්ධ කර ගන්නා කතුවරයා සංවාද ඇසුරින් මෙන්ම සෙසු චරිත ලවා කියවීමෙන් පාඨකයා වෙත ඉදිරිපත් කෙරේ. මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයාගේ කාර්යභාරය පිළිබඳ අදහස් දක්වන්නේ සුගතන්ය. කතුවරයා ඔහුගේ මුවට නංවන භාෂණය සෞඛ්‍ය පරීක්ෂක වරයාගේ ක්‍රියාශීලී රාජකාරිය අකුරට ඉටු කරන නිලධාරියෙකුගේ ස්වභාවය ගම්‍යමාන කරයි. එමෙන්ම වේලාව ගැන පවා තැකීමක් නොකර ඉටුකළ යුතු රාජකාරි කොටස නිම කරන මහත්මා ගති ගුණ ද ඔහු සතුය. කෙසේ හෝ මේ නූගත් ගැමියන් තමා පැමිණි අරමුණ වන වැසිකිළි තැනීමේ කාර්යයේ නිරත කරවනු වස් පුරෝගාමී මෙහෙවරක නිරත වූවෙකි.

''සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ. මම ආයෙමත් සුමාන දෙකකට පස්සෙ එනවා. එතකොට වැසිකිළියක් හදල නොතිබුණොත් නඩු දානවා.''

මේ සංවාදය සජීවීය. රජයේ නිලධාරියෙක් ලෙස ඉතා තදින් නීතිය ක්‍රියාත්මක කරන සෞඛ්‍ය පරීක්ෂක වරයාගේ චරිතය කතුවරයා ගොඩනගන්නේ යථාරූපීවය. වැසිකිළිය යන නම පවා පිළිකුල් කළ ජනතාවක් වසූ ගමක ගෙයක් පාසා වැසිකිළියක් ඉදි කරවීම පහසු කටයුත්තක් නොවේ. ගැමියන්ගේම සෞඛ්‍ය තත්වය වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස මෙය ක්‍රියාත්මක වුවද සෞඛ්‍ය පරීක්ෂක වරයා මේ වෙනුවෙන් පුරෝගාමී ව කටයුතු කරන ආකාරය අපට පසක් වේ. රජය විසින් පවරා දුන් රාජකාරිය වූ ගැමි ජනතාව සෞඛ්‍ය පුරුදු වලට හුරු කරවීමේ භාරදූර වගකීම ඉටු කරන්නට සෞඛ්‍ය පරීක්ෂකවරයා දැඩි හින්දු තීරණ ගත්තේ ය.

''මල්ලීත් නංගීත් එය වෙන වැඩකට යොදා ගත්ත. එනම් සෙල්ලම් බත් ඉව්මටත්, සෙල්ලම් කඩ දැමීමටත් ය.''

වැසිකිළි තනා නිමවූවත් එය නිවැසියන් මුලදී පරිහරණයට නොපෙළඹේ. ඔවුන්ගේ මුල් බැසගත් චර්යා රටාවන් වෙනස් වන්නේ ද ඉතා සෙමිනි. එහෙත් අධ්‍යාපනය මගින් ජන සමාජගත සිරිත්-විරිත් පවා වෙනස් කළ හැකිය. මෙහිදී සමාජ පරිවර්තනයකට මුල හේතුව අධ්‍යාපනය බව කෙටි කතා කරුවා ව්‍යංගයෙන් අපට සන්නිවේදනය කරයි. කථකයා පාසලෙන් ලැබූ එඩිමත් අධ්‍යාපනය නිසාත් ගෙදර ආසන්නයේ වැසිකිළියක් තිබීම නිසාත්, අලුත් පුරුද්දකට හැඩුරුවීමට ළමාකළ ඇතිවන හොතිත් ආශාව නිසාත් අන් කාටත් පෙරාතුව, කාටත් හොරෙන් වැසිකිළිය පරිහරණය කිරීමට පෙළඹෙන්නේ කථකයාය.

මෙසේ වැසිකිළි තැනවීමේ ව්‍යාපාරයේ නියමුවා මහජනපරීක්ෂක තුමා වුවද, එය ප්‍රථමයෙන්ම පාවිච්චි කිරීමට පෙළඹී ඇත්තේ කථකයා බව තුළ ගන්වා ඇති ආකාරය ප්‍රශස්තය. ඉන් අනතුරුව මල්ලී ද නංගී ද එයට අන්වර්තනය වී වැසිකිළිය පාවිච්චියට පෙළඹෙති. කෙසේ වුවද ජයග්‍රහණය ලබා ගන්නා ලද්දේ පාඨකයා විසිනි.

03. ''අපට වැසිකිළියක්'' කෙටි කතාව සඳහා යොදාගත් භාෂාව එය සාර්ථකත්වයට පත්වීමට එක් හේතුවකි. විමසන්න.

ජේ. ජයතිලක ගුරුන්ගේ ''නොනිමි සිත්තම'' නම් කෙටි කතා සංග්‍රහයේ එන ''අපට වැසිකිළියක්'' කතා පුවත මීට දශක අටකට නවයකට පෙර ලක්දිව අන්ත පිටිසර ගම් පියසක සිදු වූ විශේෂිත ක්‍රියාදාමයක් අරමුණු කරගනිමින් ලියවුණකි. කෙටි කතාවක්, නවකතාවක් හෝ ගීතයක් යන ඕනෑම සාහිත්‍යාංගයක සාර්ථකත්වය කෙරෙහි මූලික ලෙසම බලපානු ලබන්නේ නිර්මාණය සඳහා යොදා ගනු ලබන භාෂාවයි. ''අපටත් වැසිකිළියක්'' කෙටි කතාව වස්තු විෂයට අනුකූලව නිර්මාණාත්මක ගැමි ව්‍යවහාරෝචිත බස්වහර උපයෝගී කර ගනිමින් රචනා වී ඇත.

''උදේ කිව්වහම උදෙත් බෑ කිව්වා. දවල් කිව්වහම දවාලුත් බෑ කිව්ව. දැන් ඉතින් හවස් වෙලානෙ. දැන්වත් ඉතින් වරෙන්.''

මේ කතා පුවතට ජීවයක් හා ප්‍රාණයක් ලබාදෙන ලෙස ගැමි ගෙදරක පරිසරයට ඔබින අක්කා සහ මල්ලී අතර ඇතිවන සංවාදය තුළින් ගැමි ජන ජීවිතයේ ස්වරූපය මැනවින් ප්‍රකට කරයි. පවුලේ වැඩිමල් සොයුරිය වන අක්කා පවුලේ බර කරට ගෙන ක්‍රියාකරන අයුරු කඳිමට ඒත්තු ගැන්වීමට කතුවරයා යොදා ගන්නා භාෂා රීතිය ප්‍රබලය. ඇයගේ මුවින් ගිලිහෙන වදන් පෙළ, ඇය තුළ ඇති ඉවසීම, පවුලට ඇති ලෙංගතු කම, සැර පරුෂ නැති සංවේදී බව ආදී අහිංසක ගැමි යුවතියක සතු මානවීය ගුණාංග රැසක් මනාවට විශද කරයි.

කෙටි කතාවේ ප්‍රබල චරිතයක් වන පියාගේ මුවට නංවන භාෂණය තාත්විකය. කතුවරයා විසින් පියාගේ ප්‍රතිරූපය සහෘද මනසේ චිත්‍රණය වන ලෙසින් එය ගොඩනංවා ඇත.

''තෝ හොර අලියා වගේ මෙතන කකා ඉන්නවා. තොට ඒකවත් කරලා දෙන්න බැරිද? කවද මෙතන අතක් පයක් නොහොල්ලන එවුන්ට පැඹිම හදලා දෙන්ඩ ඉන්නේ?''

මේ සංවාදය තුළින් ජනිත වන අවස්ථා සිද්ධි ලෙස ගැළපීම සඳහා යොදා ගත් කට වහර ප්‍රබලය. ''හොර අලියා වගේ'' යනු ගැමි උපමාවාචී වහරකි. ''පැඹිම'' මේ ආහාර සඳහා ගැමියන් යෙදූ නවත් නමකි. ''බැහ්... බැහ්... කට විතරයි හොල්ලන්න පුළුවන්'' මේ ගැමි ගෙදරක ඇසෙන සරළ වදන් මාලාවකි. ගැමි ජන ජීවිතය කේන්ද්‍ර කරගත් කතාවක් ගොතන කතුවරයා ඒ සඳහා යෙදිය යුතු භාෂාව කෙබඳු විය යුතු දැයි ඉතා හොඳින් වැසිලිමත් වූ බවට සාක්‍ෂ්‍ය පූර්වෝක්ත උපුටනය මගින් පෙන්වා දෙයි. ගැමි වහරට අනුකූලව කථන බස යොදා ගැනීම නිසා පාඨකයාට කෘතියේ නියම රස දැනවීමට කතුවරයා සමත් වෙයි. දරයි. ගැමි ජන විඥානයෙන් උකහා ගත් ගැමි වහර මුසු ස්වාධීන කථා රීතියක් කතුවරයා සිය කෙටි කතාවට උපයුක්ත කරගනී.

''කවද මේ ගෙදර ගෘහමූලිකයා?'' ඔහු කථා කළේ කවර භාෂාවකින් ද? වචන සිංහල වුවත් උච්චාරණය සිංහල නොවිය.

ගැමි වහරට එහා ගිය ශිෂ්ට සම්පන්න ආකාරයකින් සෞඛ්‍ය පරීක්‍ෂක වරයාගේ දෙබස් ගොඩනගන කතුවරයා ඔහුගේ රාජකාර්මය ස්වභාවයත් සැරපරුෂ ගති ගුණත් මනාවට පිළිබිඹු කරයි. ගැමියන්ගේ ජීවන රටාව සජීවී ආකාරයෙන් නිරූපණය කිරීමට සෞඛ්‍ය පරීක්‍ෂකවරයා සමඟ වන සංවාද ඉවහල් කරගනී. බියාදු යටහත් පහත් ස්වරයෙන් කතා බහේ යෙදෙන ගැමියනුත් නීතිය, අණ කිරීම්, තර්ජන කැටිකොට ගත් සෞඛ්‍ය පරීක්‍ෂක වරයාගේ භාෂණත් කෙටි කතාව සිනමා රූ පෙළක් මෙන් පාඨකයා ඉදිරියේ මවන්නට හේතු සාධක වෙයි.

අන්ත පිටිසර නොදියුණු ගම්මානවල අසරණ ගැමියන්ගේ ගෙවල්වලට ගොස් රජයේ නිලධාරීන් සිදු කරන අත්තනෝමතික හැසිරීම් රටාවත් ඒවා නිසා දහසතුන් එකක් අඩුපාඩු, දුක් ගැහැට මැද ජීවත්වන ගැමියන් තවත් අසරණයින් බවට පත් වන ආකාරයත් කතුවරයා හෙළි කරන්නේ සානුකම්පිතවය.